අන්තර්ජාල අනුවාදයකි.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 1 දරන සර්රම් ශ්‍රී ලංකා ජාතික පදනම(සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 පෙබරවාරි මස 10 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 පෙබරවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **5.75** තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**1999 අංක 1 දරන සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම**
**(සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1999 පෙබරවාරි මස 10 වැනි දින.]

එල්. ඩී.– ඕ. 28/96.

# සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මඩකලපුව දිස්ත්‍රික්කයේ, අරෙපත්තයි, තලන්කුඩා හි පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 1 දරන සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එහි සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. — සරිරම් ශ්‍රී ලංකා ජාතික පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. :– — සංස්ථාවේ පොදු පරමාර්ථය.

*(අ)* සියලු ම ජන කොටස් අතර සාමය හා සමාදානය පවත්වා ගැනීම ;

(ආ) ජනතාව අතර ඇති ජනවාර්ගික, භාෂාමය, ආගමික, දේශපාලන හා වාර්ගික විෂමතාව පිටුදැකීම ;

(ඇ) විවිධ ආගමික, සංස්කෘතික සහ ආර්ථික සමූහ ඒකාබද්ධ කරන පොදු සමාජයක් පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) දුප්පත් ජනතාව සහ පීඩනයට පත් ජනතාව "දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමයකට" ගෙන ඒම සහ ඔවුන් ස්වයං රැකියා වැඩපිළිවෙලවල්වල යෙදීමට දිරිමත් කිරීම ;

(ඉ) ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව අතර ඉතිරි කිරීම දිරිමත් කිරීම හා එය වේගවත් කිරීම ;

(ඊ) පාසල් අධ්‍යාපනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ පරිසර අධ්‍යාපනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ; සහ

(උ) ඉහත කී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආනුෂංගික හා හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරෙන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ පරිපාලන කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව තෝරා පත් කරගනු ලබන්නා වූ කළමනාකරණ කමිටුවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය. එකී කළමනාකරණ කමිටුව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව තෝරා පත් කරගනු ලැබූ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික සහ දහසය දෙනකුට නොඅඩු වෙනත් සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මෙහි උපලේඛනයේ නම සඳහන්ව ඇත්තා වූ සාමාජිකයන්ගෙන් සමන්විත පදනමෙහි කළමනාකරණ කමිටුව සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම සම්බන්ධයෙන් ද, නිලධාරි සහ කළමනාකරණ කමිටුව තෝරා පත්කර ගැනීම සඳහා ද කළමනාකරණ කමිටුවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල, වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ සති දෙකක දැන්වීමකින්, ඒ කරුණු සඳහා ම කැඳවනු ලබන සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසුව එවැනි ම රැස්වීමක දී එවැනි ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදින පදනමට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ පදනමට ගෙවිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු කරනු ලබන යම් දේපළක්, අත්කර ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්නුතාව සංස්ථාවට ඇති අතර, ඒ සියලු දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9**. සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ රීතිවලට යටත්ව සභාපතිවරයා සහ නියමිත සාමාජික සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය** (5(2) වගන්තිය)

| | |
|---|---|
| සභාපති : | ඒ. ලෝගේස්පරන් මහතා |
| උප සභාපතිවරු : | ඒ. සිවලිංගම් මහතා |
| | එල්. ආනන්දි මහත්මිය |
| | එම්. කාසිපිල්ලෙයි මහතා |
| ප්‍රධාන ලේකම් : | කේ. වන්නියසිංගම් මහතා |
| අතිරේක ලේකම්වරු : | ඒ. ක්‍රිෂ්ණමූර්ති මහතා |
| | එම්. පුෂ්පරාජ් මහතා |
| | එම්. සුන්දරලිංගම් මහතා |
| භාණ්ඩාගාරික : | කේ. වෙල්ලයිසාමි මහතා |
| විධායක සාමාජිකයන් : | එස්. කේ. පොන්නම්බලම් මහතා |
| | වී. ජේසුදාසන් මහතා |
| | ටී. බැප්ටිස්ට් මහතා |
| | කේ. ලිංගරාජ් මහතා |
| | ටී. ෂ්‍යාමලා මෙනෙවිය |
| | ටී. සිත්තම්පලම් මහතා |
| | එන්. නිශයාන්ති මෙනෙවිය |
| | එම්. ඩිලානි මෙනෙවිය |
| උපදේශකවරු : | කේ. තංගරාජා මහතා |
| | ආර්. තුරෙයිරාජසිංගම් මහතා |
| | ජී. රාධක්‍රිෂ්ණම් මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.